# දසමො පාඨො

## සුවො



සුවස්ස කීරො’ති අපරනාමං හොති. එසො පක්ඛී අතිරුචිරවණ්ණො ච නරානං පියො ච හොති. තස්ස පක්ඛපත්තානි හරිතානි. පාදානි සුවණ්ණවණ්ණානි ච දීඝානි ච භවන්ති. චඤ්චු ච ලොහිතා. තස්ස වාලධී ච අතිමනොහරා. තථෙව දීඝා. එතෙ පක්ඛිනො අරඤ්ඤෙසු උත්තුඞ්ගරුක්ඛෙසු සුසිරානි කත්වා සුඛං විහරන්ති. මධුරානි ඵලානි ච වීහයො ච ඛාදන්ති. එතෙ කදාචි න මංසානි ඛාදන්ති. මරිචං සුවානං පියං. ලොණං සුවානං විසං භවති. තෙසං චඤ්චු වඞ්කා. තථෙව අතිතිඛිණා. ඵලානි විදාලෙත්වා ඛාදන්ති. එතෙ පක්ඛිනො ගණගණා’ව විහරන්ති. සණ්ඩසණ්ඩා’ව ගගනතලෙ උඩ්ඩෙන්ති. තෙ එකකො’ව කදාචි’පි න ජීවන්ති. මනුස්සා සුවපොතකෙ ගහෙත්වා අයොමයෙසු පඤ්ජරෙසු පක්ඛිපිත්වා පොසෙන්ති. සම්මා සික්ඛාපිතා සුවපොතකා මනුස්සා විය මනුඤ්ඤං භාසන්ති. තස්මා මනුස්සා සුවපොතකෙසු දයං කරොන්ති.

(පාලි රචනා 2)

**පදමාලාව**

| | | |
|---|---|---|
| **සුවො** | - | ගිරවා |
| **කීරො** | - | ගිරවා |
| **අපර** | - | අනික් / වෙනත් |
| **පක්ඛී** | - | පක්ෂි |
| **අතිරුචිරවණ්ණ** | - | ඉතා මනහර වර්ණැති |
| **පක්ඛපත්තානි** | - | පියාපත් |

| | |
|---|---|
| **හරිත** | කොළපාට |
| **සුවණ්ණවණ්ණ** | රන්වන් |
| **චඤ්චු** | හොටය |
| **ලොහිත** | රතුපාට |
| **වාලධී** | වලිග |
| **උත්තුඞ්ගරුක්ඛ** | ඉතා උස් ගස් |
| **මරිච** | මිරිස් |
| **වඞ්ක** | වක් |
| **විදාලෙති** | පළයි |
| **සණ්ඩසණ්ඩ** | රංචු රංචු |
| **අයොමය** | යකඩින් කළ |
| **මනුඤ්ඤං** | සිත්කලු (ලෙස) |
| **දයං කරොති** | ආදරය කරයි |

## අභ්‍යාස

**කිං** - කුමක් **කීදිසං** - කෙබඳු **කුහිං** - කොහි **කථං** - කෙසේ

1. 'සුවො' ඡේදය සිංහලට නගන්න.
2. පාලියෙන් පිළිතුරු ලියන්න.

උදා: **කානි සුවණ්ණවණ්ණානි ච දීඝානි ච භවන්ති?**
**පාදානි සුවණ්ණවණ්ණානි ච දීඝානි ච භවන්ති**

i. කිං සුවස්ස අපරනාමං?
ii. සුවස්ස රූපං කීදිසං?
iii. තෙ කුහිං ජීවන්ති?
iv. කිං සුවානං පියං?
v. කිං සුවානං විසං?
vi. සුවානං චඤ්චු කීදිසො?
vii. සුවා චඤ්චූහි කිං කරොන්ති?
viii. එතෙ පක්ඛිනො කථං විහරන්ති? කථං උඩ්ඩෙන්ති?
ix. මනුස්සා සුවපොතකෙ කථං පොසෙන්ති?
x. සම්මා සික්ඛාපිතා සුවපොතකා කථං භාසන්ති?

# වාක්‍ය නිර්මාණය

## වර්තමානකාල සරල වාක්‍ය නිර්මාණය

භාෂාවක් නිර්මාණය වීමට අක්ෂර, පද හා වාක්‍යය යන කොටස් තුන අවශ්‍ය වේ. අක්ෂර නිසා පදත්, පද නිසා වාක්‍යයත්, වාක්‍යය නිසා භාෂාවත් නිර්මාණය වේ. ඕනෑ ම භාෂාවක වාක්‍යය නිර්මාණය පිළිබඳ පළමු පියවර වන්නේ සරල වාක්‍යයක් නිර්මාණය කිරීමට ඉගෙනීමයි.

සරල වාක්‍යයක් නිර්මාණය කර ගැනීමට ප්‍රධාන පද දෙකක් අවශ්‍ය වේ. එනම්, උක්තපදය හා ආඛ්‍යාතපදයයි.

| උක්තපදය | ආඛ්‍යාත පදය | සරල වාක්‍ය |
|---|---|---|

කර්තෘකාරක වාක්‍යයක **කර්තෘපදය** උක්ත වේ. කර්මකාරක වාක්‍යයක **කර්මපදය** උක්ත වේ. **උක්තවීම** යනු ප්‍රධාන වීමයි. හෙවත් ආඛ්‍යාත පදයෙන් උක්තපදයේ ලක්ෂණ ප්‍රකාශවීමයි. කර්තෘකාරක සෑම වාක්‍යයක ම උක්තපදය පඨමා විභක්තියෙන් සිටියි.

උදා:- ගජො ගච්ඡති.

මෙම කර්තෘකාරක වාක්‍යයේ '**ගජො**' යන කර්තෘපදයේ ඇති ප්‍රථමපුරුෂ එකවචන ලක්ෂණ '**ගච්ඡති**' යන ආඛ්‍යාත පදයෙන් ද ප්‍රකාශ වී තිබේ. '**ගච්ඡති**' යනු ප්‍රථමපුරුෂ එකවචන කර්තෘකාරක ආඛ්‍යාත පදයකි.

| පුරිස | එකවචන | බහුවචන |
|---|---|---|
| **පඨම පුරිස** | සො (ඔහු) | තෙ (ඔවුහු) |
| **මජ්ඣිම පුරිස** | ත්වං (නුඹ) | තුම්හෙ (නුඹලා) |
| **උත්තම පුරිස** | අහං (මම) | මයං (අපි) |

ඉහත වගුවෙහි දක්නට ලැබෙන්නේ පුරුෂ භේදය නාමපදවල දක්නට ඇති ආකාරයයි. ඒ අනුව උත්තම පුරුෂයට **අහං** - **මයං** යන පද දෙකත්, මධ්‍යමපුරුෂයට **ත්වං** - **තුම්හෙ** යන පද දෙකත් යෙදේ. සෙසු සියලු නාමපද ප්‍රථමපුරුෂයෙන් යෙදේ. මෙහි උත්තමපුරුෂයෙන් තමන් පිළිබඳවත්, මධ්‍යම පුරුෂයෙන් ඉදිරියෙහි සිටින්නන් පිළිබඳවත්, ප්‍රථමපුරුෂයෙන් අන්‍යයන් පිළිබඳවත් ප්‍රකාශ වේ.

උක්තය හා ආඛ්‍යාතය අතර ඇති මනා සම්බන්ධය පුරුෂභේදය හා වචනභේදය පදනම් කරගෙන ඇති වේ. නාමපද හා ක්‍රියාපද අතර ඇති සමාන බව එම ලක්ෂණ දෙක ඇසුරින් පමණක් පෙනෙන නිසා ය.

| උක්තය | | | ආඛ්‍යාතය | | |
|---|---|---|---|---|---|
| පඨමපුරිස | ඒකවචන | සො | ගච්ඡති | ඒකවචන | පඨමපුරිස |
| | බහුවචන | තෙ | ගච්ඡන්ති | බහුවචන | |
| මජ්ඣිමපුරිස | ඒකවචන | ත්වං | ගච්ඡසි | ඒකවචන | මජ්ඣිමපුරිස |
| | බහුවචන | තුම්හෙ | ගච්ඡථ | බහුවචන | |
| උත්තමපුරිස | ඒකවචන | අහං | ගච්ඡාමි | ඒකවචන | උත්තමපුරිස |
| | බහුවචන | මයං | ගච්ඡාම | බහුවචන | |

ඉහත වගුවෙහි දැක්වෙන පරිදි උක්තය ප්‍රථමපුරුෂ නම් ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ වීමත්, උක්තය ඒකවචන නම් ආඛ්‍යාතය ඒකවචන වීමත් අනිවාර්ය වූවකි. ඒ අනුව සරල වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය අතර ඇති සම්බන්ධය මෙසේ හඳුනා ගනිමු.

I. **උක්තය ප්‍රථමපුරුෂ ඒකවචන නම් ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ ඒකවචන විය යුතු ය.**

**සො ගච්ඡති.**
**බුද්ධො දෙසෙති.**

II. **උක්තය ප්‍රථමපුරුෂ බහුවචන නම් ආඛ්‍යාතය ප්‍රථමපුරුෂ බහුවචන විය යුතු ය.**

**තෙ ගච්ඡන්ති.**
**බුද්ධා දෙසෙන්ති.**

III. උක්තය මධ්‍යමපුරුෂ ඒකවචන නම් ආඛ්‍යාතය මධ්‍යමපුරුෂ ඒකවචන විය යුතු ය.

**ත්වං ගච්ඡසි.**

**ත්වං වන්දසි.**

IV. උක්තය මධ්‍යමපුරුෂ බහුවචන නම් ආඛ්‍යාතය මධ්‍යමපුරුෂ බහුවචන විය යුතු ය.

**තුම්හෙ ගච්ඡථ.**

**තුම්හෙ ලිඛථ.**

V. උක්තය **උත්තමපුරුෂ** ඒකවචන නම් ආඛ්‍යාතය **උත්තමපුරුෂ** ඒකවචන විය යුතු ය.

**අහං ගච්ඡාමි.**

**අහං පඨාමි.**

VI. උක්තය **උත්තමපුරුෂ** බහුවචන නම් ආඛ්‍යාතය **උත්තමපුරුෂ** බහුවචන විය යුතු ය.

**මයං ගච්ඡාම.**

**මයං සුණාම.**

ඒ ඒ ශබ්ද ලිංග වශයෙන් හා අන්ත වශයෙන් වෙනස් ව වරනැගෙන නිසා උක්තපදය සාදා ගැනීම පාලි නාම වරනැගීම ආශ්‍රයෙන් හඳුනාගත යුතු ය. පහත දැක්වෙන්නේ විවිධ ශබ්ද පඨමා විභක්තියේ වරනැගී ඇති ආකාරයයි.

| පඨමා විභත්ති | | |
|---|---|---|
| ශබ්දය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධො | බුද්ධා |
| රාජ | රාජා | රාජානො |
| අග්ගි | අග්ගි | අග්ගී, අග්ගයො |
| ගච්ඡන්ත | ගච්ඡං, ගච්ඡන්තො | ගච්ඡන්තො, ගච්ඡන්තා |
| ගුණවන්තු | ගුණවා, ගුණවන්තො | ගුණවන්තො, ගුණවන්තා |

| | | |
|---|---|---|
| දණ්ඩී | දණ්ඩී | දණ්ඩී, දණ්ඩිනො |
| භික්ඛු | භික්ඛු | භික්ඛු, භික්ඛවො |
| පිතු | පිතා | පිතරො |
| සත්ථු | සත්ථා | සත්ථාරො |
| කඤ්ඤා | කඤ්ඤා | කඤ්ඤා, කඤ්ඤායො |
| මාතු | මාතා | මාතරො |

උදා:-

| එකවචන | බහුවචන |
|---|---|
| රාජා යුජ්ඣති. | රාජානො යුජ්ඣන්ති. |
| අග්ගි පජ්ජලති. | අග්ගයො පජ්ජලන්ති. |
| භික්ඛු වන්දති. | භික්ඛවො වන්දන්ති. |
| පිතා කසති. | පිතරො කසන්ති. |
| කඤ්ඤා හසති. | කඤ්ඤායො හසන්ති. |
| මාතා පචති. | මාතරො පචන්ති. |

## කර්මපදයක් සහිත වාක්‍යය නිර්මාණය

කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය කර්මපදයයි. කර්තෘකාරක වාක්‍යයවල දී එම කර්මපදය දුතියා විභක්තියෙන් යෙදේ.

ලුද්දකො මිගං මාරෙති.

මෙම වාක්‍යයෙහි **ලුද්දකො** යන කර්තෘපදය සිදුකරන ක්‍රියාව වන්නේ **මාරෙති** යන්නයි. මෙහි කර්තෘ කරන ක්‍රියාවට යටත් වන පදය ලෙස **මිගං** යන්න යෙදී තිබේ. එය කර්මාර්ථය ප්‍රකාශ කරන නිසා දුතියා විභක්තියෙන් සිටියි. ඕනෑ ම වාක්‍යයක සකර්මක ධාතුවකින් සෑදුණු ආඛ්‍යාත පදයක් ඇති විට ඊට කර්මපදයක් එක් කළ හැකි ය.

ඒ ඒ ශබ්ද ලිංග වශයෙන් හා අන්ත වශයෙන් වෙනස් ව වරනැගෙන නිසා දුතියා විභක්ති පදයක් සාදා ගැනීම පාලි නාම වරනැගීම ඇසුරෙන් හඳුනාගත යුතු ය. පහත දැක්වෙන්නේ විවිධ ශබ්ද දුතියා විභක්තියේ වරනැගී ඇති ආකාරයයි.

| දුතියා විභත්ති | | |
|---|---|---|
| බුද්ධ | බුද්ධං | බුද්ධෙ |
| රාජ | රාජානං, රාජං | රාජානො |
| අග්ගි | අග්ගිං | අග්ගී, අග්ගයො |
| ගච්ඡන්ත | ගච්ඡන්තං | ගච්ඡන්තෙ |
| ගුණවන්තු | ගුණවන්තං | ගුණවන්තෙ |
| දණ්ඩී | දණ්ඩිනං දණ්ඩිං | දණ්ඩී, දණ්ඩිනො |
| භික්ඛු | භික්ඛුං | භික්ඛූ, භික්ඛවො |
| පිතු | පිතරං | පිතරෙ, පිතරො |
| සත්ථු | සත්ථාරං | සත්ථාරෙ, සත්ථාරො |
| කඤ්ඤා | කඤ්ඤං | කඤ්ඤා, කඤ්ඤායො |
| මාතු | මාතරං | මාතරෙ, මාතරො |

උදා:-

උපාසකො බුද්ධං වන්දති. උපාසකා බුද්ධෙ වන්දන්ති.
භික්ඛු **රාජං** ඔවදති. භික්ඛවො **රාජානො** ඔවදන්ති.
බ්‍රාහ්මණො **අග්ගිං** ජාලෙති. බ්‍රාහ්මණා **අග්ගයො** ජාලෙන්ති.
අසප්පුරිසො **භික්ඛුං** ගරහති. අසප්පුරිසා **භික්ඛවෙ** ගරහන්ති.
පුත්තො **පිතරං** සක්කරොති. පුත්තා **පිතරෙ** සක්කරොන්ති.

කර්තෘකාරක වාක්‍යවල දී කර්මපදය ඒකවචනයෙන් හෝ බහුවචනයෙන් තිබීම නිසා උක්තය හා ආඛ්‍යාතය අතර වෙනසක් සිදු නො වේ. සුදුසු පරිදි කර්මපදය දුතියා විභක්ති ඒකවචනයෙන් හෝ බහුවචනයෙන් යෙදිය හැකි ය.

උදා:-

උපාසකො බුද්ධං වන්දති. (උපාසකයා බුදුරදුන් වඳියි.)
උපාසකා බුද්ධං වන්දන්ති. (උපාසකවරු බුදුරදුන් වඳිති.)
උපාසකො බුද්ධෙ වන්දති. (උපාසකයා බුදුවරුන් වඳියි.)
උපාසකා බුද්ධෙ වන්දන්ති. (උපාසකවරු බුදුවරුන් වඳිති.)

ආඛ්‍යාත පදය වෙනස්වීමට කර්මපදය බලනොපාන බව ඉහත නිදසුන් ඇසුරෙන් වටහා ගන්න. ආඛ්‍යාතය වෙනස් වන්නේ කර්තෘපදය අනුව පමණි.

## අභ්‍යාස

1. පහත වාක්‍යවල හිස්තැන් සුදුසු පද යොදා පුරවන්න.

i. භාෂාවක් නිර්මාණය වීමට ................ ...................... හා ........................ යන කොටස් තුන අවශ්‍ය වේ.
ii. කර්තෘකාරක වාක්‍යයක උක්ත වන්නේ ...................................... පදයයි.
iii. කර්මකාරක වාක්‍යයක උක්ත වන්නේ ........................................ පදයයි.
iv. සෑම වාක්‍යයක ම උක්තපදය තිබෙන්නේ ........................... විභක්තියෙනි.
v. ගචඡති යනු ............... පුරුෂ, ............ වචන, .................... කාරක ආඛ්‍යාත පදයකි.
vi. උක්තය ප්‍රථමපුරුෂ එකවචන නම් ආඛ්‍යාතය ................ ................ විය යුතු ය.
vii. උක්තය වශයෙන් උත්තමපුරුෂ එකවචනයේ යෙදෙනුයේ .................. යන නාමපදයයි.
viii. උක්තය වශයෙන් මධ්‍යමපුරුෂ බහුවචනයේ යෙදෙනුයේ .................... යන නාමපදයයි.
ix. කර්තෘකාරක වාක්‍යයවලදී කර්මපදය ................... විභක්තියෙන් සිටියි.
x. මාතු ශබ්දය පඨමාවිභක්ති එකවචනයේ ........................... යනුවෙන් ද බහුවචනයේ ................... යනුවෙන් ද වරනැගේ.

2. පහත දැක්වෙන ආකාරයේ පාලි වාක්‍යය ලියා දක්වන්න.

i. ප්‍රථමපුරුෂ ඒකවචන වාක්‍යය තුනක් සාදන්න.
ii. එම වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.
iii. මධ්‍යමපුරුෂ ඒකවචන වාක්‍යය තුනක් සාදන්න.
iv. එම වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.
v. උත්තමපුරුෂ බහුවචන වාක්‍යය තුනක් ලියන්න.
vi. එම වාක්‍යය ඒකවචනයට හරවා ලියන්න.

3. ලිංග වශයෙන් හා අන්ත වශයෙන් වෙනස් ව වරනැගෙන ශබ්ද දහයක් තෝරා ගෙන ඒවා පඨමා විභක්තියේ වරනැගෙන අයුරු වගුවක ලියා දක්වන්න.

4. පහත වාක්‍යවල හිස්තැන් සුදුසු කර්මපද යොදා සම්පූර්ණ කරන්න.

i. පුරිසො ................ (ගොණ) පහරති.
ii. ගොණො .................. (සට) ඡින්දති.
iii. සොමපාලො .................. (ගාම) ගච්ඡති.
iv. දෙවදත්තො ................... (පබ්බත) ආරුහති.
v. සා ................... (වාපි) ඔතරති.
vi. මනුස්සා .................... (ථෙර) වන්දන්ති.
vii. සොණා ................. (චොර) අනුබන්ධන්ති.
viii. ව්‍යග්ඝා .................... (මිග) මාරෙන්ති.
ix. බිළාලා .................. (මූසික) ගණ්හන්ති.
x. වානරා ................. (රුක්ඛ) ආරුහන්ති.

5. පහත වගුවේ ඇති පද සුදුසු පරිදි යොදා වාක්‍යය දහයක් නිර්මාණය කරන්න.

| උක්තපදය | කර්මපදය | ආඛ්‍යාතය |
|---|---|---|
| බාලකො | ජලං | ඔවදති |
| ආචරියො | පුප්ඵානි | පිබාමි |
| යාචකො | ගාමං | පූජෙථ |
| බුද්ධො | භික්ඛුං | භුඤ්ජාම |
| සිස්සා | ධම්මං | යාචති |
| අහං | පොත්ථකානි | දෙසෙති |
| තුම්හෙ | කන්දුකං | පඨන්ති |
| මයං | සිස්සෙ | පහරති |
| ත්වං | ඔදනං | ගච්ඡසි |

**සබ්බගන්ථප්පහීනස්ස, පරිළාහො න විජ්ජති**

**සියලු කෙලෙස් ගැට ප්‍රහීන කළ උතුමන්ට සිත් තැවුලක් නො වේ.**

(ධම්මපදපාළි, අරහන්තවග්ග, 1 ගාථාව)